# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,523 — 1965 ඔක්තෝබර් 4 වැනි සඳුද— 1965.10.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍ර කා ශ න ය යි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට බටහිර චාරිකාවේ හලාවත හා පුත්තලම මහේස්ත්‍රාත් වරුන්ගේ කොට්ඨාශ සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස එකොළොස් වන දින පෙරවරු 11 ට මීගමුවේ අධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාටම මම මෙයින් නියමකොට දැනුම් දෙමි.

පී. ඊ. වීරමන්,
වයඹ පළාතේ පිස්කල්.

වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 30 වන දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

10–328

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

125——ආර් 9384—1,775 (65/9)